ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>My Red Comrade චිත්‍රපටිය ප්‍රදර්ශනය කරමින් අධ්‍යක්ෂ සුදත් මහදිවුල්වැව මහතා සමඟ පැවති අන්තර් ක්‍රියාකාරී සැසියක් සමඟින් ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ සුහද හමු මාලාව අඛණ්ඩව ඉදිරියට</u>**

කොළඹ, ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය අද දින සිය සුහද හමු මාලාවේ නවතම පරිච්ඡේදයක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකාවේ සිනමාපටයක් වන My Red Comrade චිත්‍රපටය ප්‍රදර්ශනය කළ අතර ඉන් අනතුරුව එම සිනමා පටයේ අධ්‍යක්ෂ සහ ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති සුදත් මහාදිවුල්වැව මහතා සමඟ අන්තර් ක්‍රියාකාරී සැසියක් ද පැවැත්වීය.

2. සිනමා ලෝලීන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ සංස්කෘතිය පිළිබඳව උනන්දුවක් දක්වන අය සහභාගී වූ මෙම වැඩසටහන සිනමාව, දේශපාලනය සහ කතාන්දර කීම පිළිබඳ හරවත් සංවාදයක් සඳහා වේදිකාවක් විය. නිර්භීත සිනමා ආඛ්‍යානයක් සහිත සිනමාත්මක සමාජ-දේශපාලන විග්‍රහයක් වන My Red Comrade චිත්‍රපටය සඳහා ප්‍රේක්ෂකයින්ගේ උණුසුම් ප්‍රතිචාර හිමි විය. චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරුව සුදත් මහාදිවුල්වැව මහතා සමඟ පැවති සාකච්ඡාව තුළින් සිනමාවේදියාගේ නිර්මාණාත්මක ගමන සහ වත්මන් සමාජ සංස්කෘතික සංදර්භය තුළ සිනමාපටයේ වැදගත්කම පිළිබඳව වැදගත් කරුණු රැසක් මතු විය.

3. මෙම වැඩසටහන 2025 මාර්තු මාසයේ දී අති සාර්ථක අයුරින් සිනමාවේදී ප්‍රසන්න විතානගේ මහතා සමඟින් පැවති සුහද හමුව සහ ඔහුගේ සම්මානලාභී ‘පැරඩයිස්’ චිත්‍රපටය ප්‍රදර්ශනයෙන් අනතුරුව පැවැත්විණ. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලබන මෙම සුහද හමු මාලාව සංස්කෘතික හුවමාරුව සඳහා

විචිත්‍රවත් වේදිකාවක් ලබා දෙමින් ශ්‍රී ලාංකික සිනමාවේ ප්‍රමුඛ පෙළේ නිර්මාණවේදීන් සමඟ සම්බන්ධ වීමට ප්‍රේක්ෂකයින්ට අවස්ථාවක් ලබා දෙයි.

4. ඉන්දිය සිනමාවේ විශිෂ්ටත්වය විදහා දක්වමින් ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් භාරතිය සිනමාවේ විචිත්‍රත්වය සහ ගැඹුර පිළිබිඹු කරන සම්භාව්‍ය සහ සමකාලීන අග්‍රගණ්‍ය සිනමාපට ද ප්‍රදර්ශනය කරයි. 2025 මැයි 2 වන දින ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විශිෂ්ට මලයාලම් සිනමාවේදියකු වන ශාජි එන්. කරුන් මහතාට උපහාරයක් ලෙස ඔහුගේ ජාත්‍යන්තර සම්මානයට පත් ‘පිරවි’ සිනමාපටය ප්‍රදර්ශනය කළේය. දෘශ්‍ය කලාවේ සහ මනුෂ්‍ය හැඟීම් ප්‍රකාශනයේ අග්‍රගණ්‍ය කලා කෘතියක් වන මෙම සිනමාපටය නැවත වරක් කරුන් මහතාගේ දක්ෂතාවය තහවුරු කරමින් ඉමහත් ප්‍රේක්ෂක ප්‍රසාදය දිනා ගත්තේය.

***

**කොළඹ**
***2025*** මැයි ***09***